**තුම්පනේ ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 අප්‍රේල් 28 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 16 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට තුම්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.

### 1.3.1 ශුද්ධ වත්කම්ල අඩුවීම.

සමුච්චිත අරමුදල පසු ගිය වර්ෂ 03 ක සිට හර ශේෂයක් පැවති අතර, සමාලෝචිත වර්ෂය වන විට හර ශේෂය ද විශාල ලෙස වැඩි වී තිබුණි. මෙය මූල්‍ය කළමනාකරණයේ දුර්වලතාවයක් බව නිරීක්ෂණය විය.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු රු.25,490 ක් වටිනා ගස් කපන යන්ත්‍රයේ වටිනාකම හා පිරිවැය තක්සේරු ජෙනරේටරයක වටිනාකරද තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආහාර පනත යටතේ නඩු පැවරීම් වෙනුවෙන් 2013 හා 2014 වර්ෂයන්ට අදාළව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත ගෙවන ලද දිරි දීමනා රු.45,500 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ආයුර්වේද මධ්‍යස්ථානයේ පැවති ඖෂධ තොගයක වටිනාකම වූ රු.214,550 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ගබඩා ද්‍රව්‍ය මිල දී ගැනීමේ දී හා නිකුත් කිරීමේ දී ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති ශේෂයට වර්ෂයේ මිල දී ගැනීම් එකතු කර, වර්ෂයේ නිකුත් කිරීම් අඩු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.1,631,361 ක තොග ශේෂයක් ගිණුමේ දක්වා තිබීමෙන් එම ශේෂය දෝෂ සහගත වී තිබුණි.

(ඉ) විසි අවුරුදු බදු පදනම මත රු.500,000 ක් ගෙවා ලබා ගෙන තිබුණු දික්ඔයවත්ත, ග්‍රීන්වුඩ් වත්ත ඉඩම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දී වෙන්දේසි කරන ලද රු.87,050 ක් වටිනා වාහන හා උපකරණ විෂයයන් 06 ක් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

**1.3.3 නොසැසදු පාලන ගිණුම්**

**------------------------------**

ගිණුම් විෂයයන් 06 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.58,169,210 ක් වුවත්, උපලේඛන අනුව, එම ශේෂයන්ගේ එකතුව රු.48,266,669 ක් වූයෙන් රු.9,902,541 ක නොසැසදීමක් අනාවරණය විය.

**1.3.4 ලැබිය යුතු ගිණුම්.**

**------------------------**

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 07 ක එකතු වටිනාකම රු.27,465,111 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.9,325,459 ක් වී තිබුණි.

**1.3.5 ගෙවිය යුතු ගිණුම්**

**---------------------**

ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකම රු.32,379,295 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.11,274,066 ක් වී තිබුණි.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**------------------------------------**

ගිණුම් විෂයයන් 03 කට අදාළ අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.31,158,375 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.7 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**--------------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මූ.රෙ.1645 | සභාව සතු සියලුම වාහන සඳහා ලොග් පොත් පවත්වා ගතයුතු වුවත්, වාහන 07 ක් සඳහා ලොග් පොත් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ආ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම මාස 06 කට වරක්ම එක් එක් වාහනයේ දැවෙන ඉන්ධන ප්‍රමාණය පරීක්ෂා කළයුතු වුවත්, වාහන 12 ක දැවෙන ඉන්ධන ප්‍රමාණය පරීක්ෂා කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියලුම රජයේ වාහනවල බදෙහි රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම පින්තාරු කළයුතු වුවත්, සභාව සතු දැනට ලියාපදිංචි කර ඇති වාහන 15 ක ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2003 අප්‍රේල් 11 දිනැති අංක සීපීසී/සීඑස්/06/06/02 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය. | (i) ඇප තැබිය යුතු නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු.20,000 ක ඇප මුදලක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.6,788,128 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.15,772,071 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලවල රු.8,983,943 ක අඩුවීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සමස්ත ඌනතාවය ඉකුත් වර්ෂයේ සමස්ත ඌණතාවය සමග සැසඳීමේ දි, රු.11,175,513 ක ඌනතාවයේ වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා ආදායම් විෂයයන් 03 ක අඩුවීම හා වියදම් විෂයයන් 03 ක වැඩිවීම මූලික වශයෙන් හේතු වී තිබුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ දී 1:1.2 ක් හා ඉකුත් වර්ෂයේදී 1:1.02 ක් වූයෙන්, එම අනුපාතය ප්‍රශස්ථ මට්ටමක නොපැවතින සමස්ත ජංගම වත්කම්වලින් සියයට 22 ක් හෙවත්, රුපියල් මිලියන 9.2 ක් කර්මාන්ත ණයගැතියන් වූ අතර, මුළු ජංගම වගකීම්වලින් සියයට 54 ක් හෙවත්, රුපියල් මිලියන 26.8 ක් කර්මාන්ත ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.

### 2.4 ආදායම් පරිපාලනය

#### 2.4.1 ආදායම් රැස් කිරිමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2015.01.01 ට හිගය | වර්ෂයේ බිල් කළ ආදායම | එකතු කළ ආදායම | | 2015.12.31 දිනට මුළු අය කලයුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | | | 2015.01.01 දිනට හිගයෙන් එකතු කළ ආදායම | 2015 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | |
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 458,987 | 883,955 | 235,666 | 696,728 | 410,548 |
| බදු කුළී | 559,812 | 3,418,358 | 559,812 | 2,372,440 | 1,045,918 |
| බලපත්‍ර ගාස්තු | -- | 1,223,225 | -- | 1,223,225 | -- |
| වෙනත් ආදායම් | 10,106,972 | 14,443,798 | 5,031,715 | 1,218,126 | 18,300,929 |
| එකතුව | | | | | 19,757,395 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.19,757,395 ක මුළු ආදායමක් හිග හිට තිබුණි.

### 2.4.2 වරිපනම් හා බදු.

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී රු.458,987 ක හිග වරිපනම් හා බදු ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.883,955 ක් විය. 2015 දෙසැම්බර් 31 දින වන විට මින් අය කර තිබුණේ පිළිවෙලින් රු.235,666 ක් හා රු.696,728 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 51 ක් හා සියයට 79 ක් විය. 2015 දෙසැම්බර් 31 දිනට රු.410,548 ක හිග ශේෂයක් පැවතිණි. 2016 ජුලි 28 දින වන විට එම හිගයෙන් රු.376,133 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

(ආ) වසර 05 කට වරක් නව තක්සේරුවක් කර, බදු අය කළයුතු වුවත්, සභාව විසින් 2004 වර්ෂයේ සිදු කරනු ලැබූ තක්සේරුව පදනම් කර ගෙන 2015 වර්ෂයට ද වරිපනම් බිල් කර තිබුණි. වරිපනම් බදු නව තක්සේරුවක් 2014 අගෝස්තු මාසයේ දී සහ 2015 ජුනි මාසයේ දී සිදු කර ඇතත්, එහි වාර්තා මෙතෙක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.4.3 බදු කුළී

සමාලෝචිත වර්ෂයේ බිල් කළ බදු කුළී ආදායම රු.3,418,358 ක් වූ අතර, මින් 2015 දෙසැම්බර් 31 දින වන විට අය කර තිබුණේ රු.2,372,440 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 69 ක් විය.

**2.4.4 කඩ කාමර බදු**

**---------------**

කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ටෙන්ඩර් ක්‍රමවේදය අනුගමනය කර, කඩ කාමර බදු දීමේ දී ටෙන්ඩර් කොන්දේසි අනුව ආපසු නොගෙවන එකවර ගෙවිය යුතු ටෙන්ඩර් මුදල් අය කිරීමෙන් පසුව කඩ කාමර පවරා දියයුතු වුවත්, කඩ කාමර 04 ක් ලබා දී වසර 02 ක් ගත වී තිබුණ ද, රු.111,150 ක ටෙන්ඩර් මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කඩ කාමර බදු දීමට පෙර මාස 03 ක කුළී මුදල් එකවර තැන්පත් වශයෙන් ලබා ගැනීමට තීරණය කර ඇතත්, කඩ කාමර 06 ක් බදු දී වසර 02 ක් ගත වී තිබුණ ද, තැන්පත් මුදල් රු.32,626 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම ශේෂයෙන් 2016 ජූලි 28 දින වන විට රු.29,626 ක ශේෂයක් තවදුරටත් අය කර ගත යුතුව තිබුණි.

(ඇ) නීත්‍යානුකූලව ගිවිසුම්ගතවීමකින් තොරව කඩ කාමර 10 ක් බාහිර පාර්ශවයන්ට බදු දී තිබුණි.

(ඈ) ගලගෙදර මඩිහේ කඩ කාමර ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ අංක 04 කඩ කාමරය මුද්‍රා තබා තිබූ අතර, එයින් අය වියයුතු හිගය රු.71,800 ක් විය. අරඹේකඩේ කඩ කාමර අංක 06 දැනට අලුත්වැඩියා කළයුතුව ඇතත්, ඒ පිළිබද අවධානය යොමු කර නොමැති අතර, අය වියයුතු හිගය රු.30,600 ක් වී තිබුණි.

(ඉ) කුළී ගෙවමින් පැවති කඩ කාමර 03 ක් ව්‍යාපාරික කටයුතු සදහා විවෘත කිරීමකින් තොරව වසා දමා තිබුණි.

(ඊ) හතරලියද්ද වෙළද සංකීර්ණයේ කඩ කාමර 05 ක් වසා දමා තිබුණි.

**2.4.5 ත්‍රී රෝද රථ ගාස්තු.**

**--------------------**

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.777,450 ක හිගයක් පැවති අතර, වර්ෂය තුළ රු.443,050 ක් හෙවත්, සියයට 56 ක් අය කර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් රු.944,700 ක් වූ අතර, රු.503,150 ක් හෙවත්, සියයට 53 ක් පමණක් අය කර ගැනීමට හැකි වී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට රු.773,700 ක හිග ශේෂයක් පැවති අතර, එම ශේෂය තුළ වසරකට වඩා අධික කාලයක සිට ත්‍රී රෝද රථ 137 කින් අය වියයුතු රු.546,750 ක් පැවතිණි. 2015 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂයෙන් 2016 ජූලි 28 දින වන විට රු.671,406 ක ශේෂයක් තවදුරටත් අය කර ගත යුතුව තිබුණි.

**2.4.6 ජල ගාස්තු.**

**----------**

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 01 දිනට හිග ජල ගාස්තු ශේෂය රු.638,583 ක් වූ අතර, වර්ෂයේ බිල් කළ ආදායම රු.985,550 ක් විය. මින් 2015 දෙසැම්බර් 31 දින වන විට අය කර තිබුණේ පිළිවෙළින් රු.328,602 ක් හා රු.656,309 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 51 ක් හා සියයට 67 ක් විය. සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.639,222 ක හිග ශේෂයක් පැවති අතර, ජල ගාස්තු අය

කිරීම දුර්වල මට්ටමක පැවතුණි. හිග ශේෂයෙන් 2016 ජූලි 28 දින වන විට රු.425,987 ක ශේෂයක් තවදුරටත් අය කර ගත යුතුව තිබුණි.

(ආ) බිල්පත් නොගෙවීම හා මාර්ග සංවර්ධන කටයුතුවල දී ජල සැපයුම් ගලවා ඉවත් කිරීම මත සභාව විසින් ජලය සපයනු ලබන ජල යෝජනා ක්‍රම 03 හී ජල පාරිභෝගිකයින් 85 දෙනෙකුගේ ජල සැපයුම් විසන්ධි කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ඔවුන්ට ජල සැපයුම නැවත ලබා දී නොතිබූ අතර, එම පාරිභෝගිකයින්ගෙන් රු.292,561 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

--------------------------------

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.1,441,333 ක් සහ මුද්දර ගාස්තු රු.15,000,849 ක් ලැබියයුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

2015 වර්ෂයට අදාළව සභා අරමුදල් යටතේ ගිවිසුම්ගත වූ කොන්ත්‍රාත් 46 න් කොන්ත්‍රාත් 25 කට අදාළව රු.14,366,057 ක වටිනාකමක් ණයහිමියන් බවට පත් කර තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඇසුරුම් ඉවත් නොකරන ලද ශීතකරණ 02 ක් ශ්‍රවණාගාරය තුළ තබා තිබූ අතර, එම උපකරණ ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි.

(ආ) ගිරිහාගම පරිගණක මධ්‍යස්ථානයට සිසුන් නොමැතිවීම හේතුවෙන්, වසා දමා තිබුණු අතර, සිසුන් ගෙන්වා ගැනීමේ වැඩපිළිවෙළක් ද නොතිබුණි.

(ඇ) සභාව සතු මුඩගම්මන ජල යෝජනා ක්‍රමය අක්‍රීයව පැවතුණි.

**3.3 ආර්ථික නොවූ ගනුදෙනු.**

----------------------------

සභාවේ සභාපති, උප සභාපති හා සභිකයින් 14 දෙනෙකු චීනයේ පැවති අධ්‍යයන වැඩමුළුවකට සහභාගි වීම සඳහා රු.2,560,000 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. චීනයේ ගුවාංෂු නගර සභාවේ කැඳවීම් ලිපියකට අනුව, 2015 මාර්තු 18 හා 19 දෙදින වැඩමුළුවක් සඳහා ආරාධනා කර තිබිය දී, මහනුවර, ගුරුදෙණියේ පිහිටි පුද්ගලික සංචාරක ආයතනය 2015 මාර්තු 17 සිට 29 යන දිනයන් හී සංචාරය සංවිධානය කර තිබුණි. එසේ වුවත්, 2015 මාර්තු 28 සිට අප්‍රේල් 03 දින දක්වා දින 07 ක් සංචාරයේ යෙදී තිබූ බව ද නිරීක්ෂණය විය. ප්‍රාදේශීය සභාවල නිල කාලය අවසන් වීමට ආසන්නව තිබිය දී, මේ ආකාරයෙන් විදේශ සංචාරවලට සහභාගීවීමෙන් කිසිදු ප්‍රතිලාභයක් සභාවට ලබා ගැනීමට නොහැකි වීම

පිළිබඳ සැලකීමකින් තොරව කටයුතු කර තිබීම නිසා, මේ සඳහා වැය කළ රු.2,560,000 ක මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය.**

**3.4.1 සුජාතා බාලිකා විද්‍යාලය ඉදිරිපිට වෙළඳ සංකීර්ණය නවීකරණය කිරිම - රු.2,057,307**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 හා 178 ප්‍රකාරව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර තරගකාරී පදනමින් කොන්ත්‍රාත්කරුවෙක් තෝරා නොගෙන එකම ගොඩනැගිල්ලේ සිදු කළයුතු රු.4,000,000 කට ආසන්න වටිනාකමින් යුත් වෙළඳ සංකීර්ණය නවීකරණය කිරීමේ කර්මාන්තය, අදියර 1 හා 2 වශයෙන් වෙන් කර ඇස්තමේන්තු 02 ක් යටතේ ප්‍රජා සංවිධාන 02 කට පවරා තිබුණි .

(ආ) 2014 වර්ෂයේ දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය මුදල් යොදා ගෙන වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ මාර්ගයට විවෘත නොවූ පිටුපස කොටසේ බිම් මහල ඉදි කර බිත්ති කපරාරු කර ජනෙල් රාමු සවි කර ඉදි කිරීම් අතර මග නවතා තිබූ අතර, මී.30X5 ක ප්‍රමාණයක් ගෙන තිබූ එම කොටසේ ඉතිරි වැඩ සම්පූර්ණ කර ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගැනීමකින් තොරව ඊට යාබද ඉහළ මාලය ඉදි කිරීමට කටයුතු කර තිබුණි. එම කොටස ද සම්පූර්ණ කිරීමකින් තොරව ඉදි කිරීම් අතර මග නවතා දමා තිබීම හේතුවෙන්, 2014 හා 2015 වර්ෂයන් හී රු.2,057,307 ක් වැය කර ඉදි කළ ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉහළ මාලය 2016 ජූනි 30 දින වන විට ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) පැරණි වෙළඳ සංකීර්ණයට යාව මී.30X5 ප්‍රමාණයේ බිම් මහළ හා ඉහළ මහළ වශයෙන් කොටස් 02 ක් ඉදි කර ඇතත්, ඒ සඳහා ගොඩනැගිලි සැළසුම් පිළියෙළ කර අනුමත කර නොතිබුණි.

(ඈ) යථෝක්ත ඉදි කිරීම් ප්‍රධාන පිවිසුම් මාර්ගයට විවෘතව ඇතත්, ගොඩනැගිල්ල මාර්ගය දෙසට විවෘතව නොපවතින බැවින්, ඉදි කරන ලද කොටස ව්‍යාපාරික කාර්යයන් සඳහා යොදවා ගැනීමේ හැකියාව ද ප්‍රශ්නගතව තිබුණි.

(ඉ) අදියර 01 හී වැඩ විෂයය අංක 05 යටතේ වහලයේ H වර්ගයේ යකඩ බාර් 08 ක් සවි කිරීම වෙනුවෙන් රු.182,688 කි ගෙවා තිබුණ ද, H යකඩ බාර් 06 ක් පමණක් සවි කර තිබූ බව 2016 ජූනි 14 දින භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූයෙන්, H වර්ගයේ යකඩ බාර් 02 ක් සඳහා රු.45,672 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(ඊ) වැඩ විෂයය අංක 08 යටතේ මි.මී.75 x 75 කොටු දැළ සවි කිරීම වෙනුවෙන් ඝන මීටර් 190.89 ක් සඳහා රු.40,469 ක් ගෙවා තිබුණ ද, 2016 ජූනි 14 දින භෞතික පරීක්ෂාවේ දී තිබූ වර්ග ප්‍රමාණය ඝන මිටර් 143.1 ක් වූයෙන් ඝන මීටර් 47.79 ක් වෙනුවෙන් රු.10,131 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(උ) වැඩ විෂයය අංක 10 යටතේ සිවිලිම ඉදි කිරීම වෙනුවෙන් ඝන මීටර් 140 ක් වෙනුවෙන් රු.328,160 ක් ගෙවා තිබුණ ද, භෞතික පරීක්ෂාවට අනුව, එවැනි සිවිලිමක් ඉදි කර නොතිබුණි.

**3.4.2 හතරලියද්ද නගර ශාලාවේ ප්‍රවේශ මාර්ගය සකස් කිරීම රු.1,470,000**

**-------------------------------------------------------------------------------**

මේ කර්මාන්තය සම්බන්ධයෙන් 2016 ජුනි 14 දින කරන ලද භෞතික පරීක්ෂාවෙන් පහත කරුණු අනාවරණය විය.

(අ) වැඩ විෂයය අංක 7 යටතේ 1:3 බදාම මිශ්‍රණයෙන් කපරාරු කිරීම සඳහා රු.60,904 ක් ගෙවීම් සිදු කර තිබුණ ද, බදාම මිශ්‍රණය ඉතා පහසුවෙන් කැඩිය හැකි දුර්වල මට්ටමේ මිශ්‍රණයක් විය.

(ආ) වැඩ විෂයය අංක 8 යටතේ ආලේප කරන ලද කැට ගල් ඇල්ලීම සඳහා දිග මී.80 ක් හා පළල මී.1.83 ක ප්‍රදේශයක වෙනුවෙන් රු.301,876 ක් ගෙවා තිබුණ ද, භෞතික පරීක්ෂාවට අනුව, එහි දිග මී. 80 ක් හා පළල මී.1.6 ක් බව නිරීක්ෂණය විය. මේ අනුව, ඉටු නොකළ වැඩ වෙනුවෙන් ව.මී.18.4 ක් සඳහා රු.37,941 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(ඇ) වැඩ විෂයය අංක 9 යටතේ තණ කොළ වැවීම සඳහා රු.31,343 ක් ගෙවා තිබුණ ද, පරීක්ෂණ අවස්ථාව වන විට නඩත්තුව අත හැර වල් බිහි වීමට ඉඩ හැර තිබුණි.

(ඈ) වැඩ විෂයය අංක 16 යටතේ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කැට ගල් තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීම වෙනුවෙන් රු.10,000 ක් ගෙවීම් කර ඇතත්, එවැනි තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගෙන නොතිබුණි. එසේම, පාට කරන ලද කැට ගල් නිසි ප්‍රමිතියෙන් තොර බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඉ) ප්‍රවේශ මාර්ගයේ ඇවිදින මං තීරුවේ දිග මී.10.7 ක් හා පළල මී.1.6 ක ප්‍රමාණයක් සහිත කොටසක් ගිලා බැස කැඩී ගොස් තිබුණි.

**3.4.3 හතරලියද්ද නව නගරයේ බස් නැවතුම් පොළ නවීකරණය කිරීම (කැට ගල් ඇල්ලීම) - රු.1,895,714**

**-------------------------------------------------------------------------------------**

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2014 ජුනි 14 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) මෙම කර්මාන්තයට අදාළ ලිපිගොනුවෙහි ඉදි කිරීමට අදාළ සැළසුම් ගොනු කර නොතිබුණි.

(ආ) වැඩ විෂයය අංක 4 හී (iv) යටතේ කොන්ක්‍රීට් කණු 08 ක් සඳහා රු.55,087 ක් ගෙවා තිබූ නමුත්, කැලී 06 ක් පමණක් ඉදි කර තිබූ බව භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය වීම නිසා, නොකළ වැඩ වෙනුවෙන් රු.13,772 ක් ගෙවා තිබුණි.

(ඇ) වැඩ විෂයය අංක 7 යටතේ කැට ගල් ඇල්ලීම සිදු කරන ලද ව.මී.365 සඳහා රු.1,133,445 ක් ගෙවා තිබුණ ද, ඒ තුළ ව.මී.(2x2.9x2.3)13.34 ක ප්‍රමාණයක බස් නැවතුම් පොළ 02 ක් ඉදි කර තිබුණු බැවින්, එහි කැට ගල් අල්ලා නොතිබිය දී ඒ සඳහා රු41,425 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(ඇ) වැඩ විෂයය අංක 10 යටතේ කොන්ක්‍රීට් පුවරු 20 ක් සවි කිරීම වෙනුවෙන් රු.95,260 ක් ගෙවා තිබූ නමුත්, භෞතික පරීක්ෂාවේ දී කොන්ක්‍රීට් පුවරු 15 ක් පමණක් සවි කර ඇති බව නිරීක්ෂණය වූයෙන්, කොන්ක්‍රීට් පුවරු 05 ක් වෙනුවෙන් රු.23,815 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(i) වැඩ විෂයය අංක 12 යටතේ මගී බංකු ඉදි කිරීම සඳහා රු.69,080 ක මුදලකට ගිවිසුම්ගත වී ඇතත්, එම විෂය ඉටු කර නොතිබූ බැවින්, අපේක්ෂිත කාර්යය ඉටු වී නොතිබුණි.

**3.4.4 අළුදෙණිය ප්‍රාදේශීය සභා ඉඩමේ සමෘද්ධිලාභීන්ගේ කෘෂි නිෂ්පාදන මිල දී ගැනීමට වෙළඳ සැළක් ඉදි කිරීම - රු.498,133**

--------------------------------------------------------------------------------------------------------

මෙම කර්මාන්තය සම්බනධයෙන් 2016 ජුනි 14 දින කරන ලද භෞතික පරික්ෂාවේදී පහත කරුණු අණාවරණය විය.

(අ) කඩ කාමර 03 ක් සඳහා අත්තිවාරම් දමා කඩ කාමර 02 ක් ආවරණය වන පරිදි කොන්ක්‍රීට් වහළය යොදා ඉන් එක් කඩ කාමරයක පමණක් වැඩ නිම කර තිබුණි. කොටසක් පමණක් වැඩ නිම කළ ගොඩනැගිල්ලේ ස්ලැබ් එකෙන් එළියට පන්නන ලද කම්බි කූරු මළ බැදී දිරාපත් වෙමින් පැවතුණි. කොන්ක්‍රීට් කුළුණු සඳහා යොදා ඇති කම්බිවල කොන්ක්‍රීට් වහළයෙන් ඉහළට ඇති කොටස පිටතට නිරාවරණය වන සේ පැවතුණි.

(ආ) 2015 වර්ෂයේ දෙසැම්බර් මස මෙම කඩ කාමරයෙහි වැඩ නිම කර තිබුණ ද, එය අරමුණුගත කාර්යයට යොදවා ගෙන නොතිබුණි.

(ඇ) යථෝක්ත ගොඩනැගිල්ල ඉදි කළ ඉඩම් කොටස පරිත්‍යාගයක් ලෙස ලැබී ඇතත්, ඒ සඳහා නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, වැට මායිම් නිශ්චය කර එය සළකුණු කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.4.5 ගලගෙදර සරත් අමුණුගම ක්‍රීඩාංගණය සැකසීම රු.132,500**

-----------------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගලගෙදර මහජන ක්‍රීඩාංගණයේ ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම සඳහා රු.150,000 ක ප්‍රතිපාදන වෙන් කර ඇතත්, ඊට අදාළ සැළසුම් හා ඇස්තමේන්තු පිළියෙළ කර නොතිබුණි.

(ආ) පුද්ගලයෙකුගේ බැකෝ යන්ත්‍රයක් උපයෝගී කර ගෙන ප්‍රවේශ මාර්ගයක් ඉදි කිරීම හා පස් ඉවත් කිරීමත් සිදු කළ බව කාර්මික නිලධාරී සටහන් මගින් අනාවරණය වුණ නමුත්, ඉටු කරන ලද ප්‍රමාණයන් සහතික කර නොතිබුණි. ඒ සඳහා රු.132,500 ක් ගෙවා තිබුණි.

(ඇ) අදාළ පුද්ගලයාගේ JCB යන්ත්‍රය මගින් දින 09 ක් ද, පැය 53 ක් සේවය ලබා දුන් බවට ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර තිබුණි. තාක්ෂණ නිලධාරීන් අදාළ කටයුත්ත අධීක්ෂණය සඳහා සහභාගී වී නොතිබුණු අතර, ක්‍රීඩාංගණ භාරකරු විසින් අධීක්ෂණය සිදු කළ බැවින්, ගෙවීම් සිදු කරන ලෙස තාක්ෂණ නිලධාරීන් විසින් වාර්තා කර තිබුණි. දින 09 ක් තුළ සිදු වූ ව්‍යාපෘතියක් තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණයට ලක් නොවීම ගැටළු සහගත විය.

(ඇ) අදාළ JCB යන්ත්‍රයෙන් පස් ඉවත් කිරීම සිදු කළ බව ක්‍රීඩාංගණ භාරකරු විසින් 2015 මාර්තු 26 දින වාර්තා කර තිබුණි. එහෙත්, 2016 ජුනි 16 දින සිදු කළ භෞතික පරීක්ෂාවේ දී පස් ඉවත් කිරීම සිදු කරන ලද ස්ථානයක් හෝ පෙන්වීමට ක්‍රීඩාංගණ භාරකරු අපොහොසත් විය. තවද, කාර්මික නිලධාරීන් විසින් ප්‍රවේශ මාර්ගයක් සකස් කළ බව පවසා තිබීමෙන් මෙම ප්‍රකාශයන් අතර පරස්පරතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

## 3.5 මානව සම්පත් කළමණාකරණය

(අ) සභාවේ අනුමත තනතුරුවල පුරප්පාඩු 13 ක් හා අතිරික්තතා 17 ක් පැවතුණි.

(ආ) නගරශාලා පරීක්ෂක හා ක්‍රීඩාංගණ භාරකරු යන තනතුරුවල සේවකයින් 02 ක් සේවයේ යොදවා ඇතත්, මෙම තනතුරු අනුමත කර ගෙන නොතිබුණි.

(ඇ) කම්කරු තනතුරුවල සේවකයින් අතිරික්තව සිටිය දී 2014 ඔක්තෝබර් 31 දින ආදේශක සනීපාරක්ෂක හා මුරකරු තනතුරු සඳහා සේවකයින් 02 ක් බඳවා ගෙන තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාවට මාර්ග කම්කරුවන් ලෙස බඳවා ගෙන තිබූ සේවකයින් 06 දෙනෙකු කාර්යාලගත වගකිවයුතු රාජකාරී කටයුතු සඳහා යොදවා ගෙන තිබුණි.

## 3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කසළ බැහැර කිරීමේ භූමියේ කසළ වෙන් කිරීම හා ගබඩා කිරීම සඳහා කාමර 02 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදි කර පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ රු.500,000 ක් වැය කර තිබුණි. එහෙත්, ප්‍රාදේශීය සභාව විසින් කසළ වෙන් කිරීමකට ලක් කිරීමෙන් තොරව බැහැර කිරීම හේතුවෙන්, ඉදි කරන ලද මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) සභා බල ප්‍රදේශයෙන් දිනකට එකතු වන කසළ ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ගලගෙදර දික්ඔයවත්ත/ ග්‍රීන්වුඩ්වත්ත නමැති ඉඩමට බැහැර කර තිබූ අතර, පරිසර බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කසළ බැහැර කරන ස්ථානයේ කසළ වෙන් කර ගබඩා කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් පැවතිය ද, නොදිරන කසළ සුළු ප්‍රමාණයක් වෙන් කර අළෙවි කර ඉතිරි කසළ නිසි කළමනාකරණයකින් තොරව වලවල් කපා වලවල් තුළට බැහැර කර තිබුණි. වර්තමානය වන විට වලවල් පිරී යාම හේතුවෙන් කසළ ගොඩ ගැනීම සිදු කරන අතර, පාරිසරික ගැටළු රාශීයක් මතුව තිබුණි.

(ඈ) පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ දිනකට එකතු වන කසළ ට්‍රැක්ටර් ලෝඩ් 01 - 02 ත් අතර ප්‍රමාණයද වෙන් කිරීමකින් තොරව මලු වශයෙන් මෙම ස්ථානයේ ප්‍රවේශ මාර්ගය දෙපස අවිධිමත්ම බැහැර කර තිබුණි.

(ඉ) මෙම ඉඩම දෙපසින් ඇළ මාර්ග 02 ක් ගලා බසින අතර, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය සභාව විසින් එකී ඇළ මාර්ගවල ජලය පරිභෝජනය සඳහා යොදා ගැනීම හේතුවෙන්

මහජනයාට බෙදා හරින ජලය අපවිත්‍ර වන බව මාවතගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් දිගින් දිගටම පෙන්වා දී තිබුණි.

(ඊ) 2016 ජූනි 14 දින සිදු කළ භෞතික පරීක්ෂාවට අනුව ගලගෙදර සුජාතා බාලිකා විද්‍යාලය අසළ වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ කසළ රැස් වී තිබූ අතර, එහි දීර්ඝ කාලයකින් කසළ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු බවක් නිරීක්ෂණය විය.

(උ) හතරලියද්ද නගරය අවට ද විශාල වශයෙන් කසළ රැස් වී තිබුණු අතර, බස් නැවතුම්පළ අසළ කාණු පද්ධතියේ ඉවතලන ප්ලාස්ටික් හා කැළි කසළවලින් පිරී පැවතිණි. හතරලියද්ද නගර ශාලාවේ වැසිකිළි පද්ධතියෙහි ඉවතලන ජලය ඉවත් කරන නළ මාර්ගවලින් මදුරුවන් ඉහළට මතු වන බව භෞතික පරීක්ෂණයේ දී නිරීක්ෂණය වූ අතර, මෙම තත්ත්වය පාලනය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 4.1 අයවැය පාලනය.

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආදායම් විෂයයන් 02 ක රු.340,000 ක් වූ ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් උපයා ගෙන නොතිබුණු අතර, වැය විෂයයන් 05 ක් සඳහා ඇස්තමේන්තුගත රු.6,480,000 ක වියදමින් කිසිදු මුදලක් වැය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 04 ක සියයට 28 සිට සියයට 96 දක්වා වියදම් විෂයයන් 05 ක සියයට 09 සිට සියයට 62 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) සභා අරමුදලින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා රු.1,600,000 ක ප්‍රතිපාදන 2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව ඇතුළත් කර ඇතත්, ඒ යටතේ රු.18,937,500 ක් වටිනා කොන්ත්‍රාත් 46 ක් සිදු කිරීමට ගිවිසුම්වලට එළඹ තිබුණි. මේ අනුව, ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඉක්මවා රු.17,337,500 ක කොන්ත්‍රාත් ගිවිසුම්වලට බැඳී තිබුණි.

(ඈ) ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ තිබිය දී, සභාවේ මන්ත්‍රීවරුන්ට විදේශ සංචාරයක් සඳහා යෑමට අවශ්‍ය මුදල් රු.1,100,000 ක් මෙම වැය විෂයයෙන් ලබා ගැනීමට ද 2015 ජනවාරි 27 දින පැවති මහා සභා රැස්වීමේ දී යෝජනා සම්මත කර තිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

**---------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය.**

**-----------------------------**

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

**4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම.**

**-----------------------------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ඇතත්, රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.5 වත්කම් කළමනාකරණය.**

**------------------------------**

**4.5.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**------------------------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු රු.1,119,619 ක් වටිනා වත්කම් විෂයයන් 03 ක් වසර 03 කට වැඩි කාල සීමාවක සිට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතයව පැවතුණි.

(ආ) ප්‍රාදේශීය සභාවට අයත් පාවිච්චියට ගත හැකි අංක 49-7666 දරන ට්‍රැක්ටරය, ටේලර් 02 ක් හා ජල බවුසරයක් ස්වාභාවික උපද්‍රවලට ලක් වෙමින් ක්‍රීඩා පිටියේ ගාල් කර තිබුණි.

(ඇ) රු.462,209 ක් වටිනා වත්කම් විෂයයන් 12 ක් හා වටිනාකම හඳුනා නොගත් යතුරු පැදි 02 ක් දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතිණි.

(ඈ) ගලගෙදර මහජන ක්‍රීඩාංගණයේ ක්‍රීඩාගාරයේ ස්ථාපිත කර තිබූ කාය වර්ධන මධ්‍යස්ථානය 2014 වර්ෂයේ දී වසා දමා තිබූ අතර, පරිත්‍යාග වශයෙන් ලද රු.231,900 ක් වටිනා කාය වර්ධන උපකරණ ප්‍රයෝජනයට ගැනීමකින් තොරව එහි කාමරයක ගොඩ ගසා තිබුණි.

**4.5.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

**--------------------------------**

2015 වර්ෂයට අදාළව පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව, පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා කාර්යාලයේ පැවති භාණ්ඩ අයිතම 08 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) පුස්තකාල 03 ක පුස්තකාල පොත් 432 ක් භාණ්ඩ සමීක්ෂණය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, 2016 මැයි 30 දින වන විටත්, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සභා කාර්යාලයේ පවතින ඉන්වෙන්ට්‍රි ලේඛනය දීර්ඝ කාලයකින් යාවත්කාලීන කර නොතිබූ අතර, ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් භාණ්ඩ නිකුත් කිරීමේ විස්තර සටහන් තබා නොතිබුණි. භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ද භාණ්ඩ නිකුත් කිරීම පිළිබඳ අවධානය යොමු කිරීමකින් තොරව ලේඛනය තුලනය කර අත්සන් යොදා තිබුණි.

**5. පද්ධති හා පාලනය.**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ණයගැති/ ණයහිමි පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය